| | | |
|---|---|---|
| **පාඨමාලා කේතය** | : | BCOM E4065 |
| **විෂයය** | : | ව්‍යාපාරික ප්‍රායෝගික පුහුණුව |
| **වර්ගය** | : | වෛකල්පිත |
| **අරමුණ** | : | සිසුන් ගේ ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීමට සහ ඔවුන් ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට අවශ්‍ය ධනාත්මක ආකල්ප නිර්මාණය කිරීම සඳහා මෙම පාඨමාලා ඒකකය නිර්මාණය කර ඇත. |
| **අධ්‍යයන ප්‍රතිඵලය** | : | මෙම පාඨමාලා ඒකකය අවසානයේදී සිසුන්: <br>• විවිධ වැඩ පරිසරයන්හී වැඩ කිරීම සඳහා අවශ්‍ය ධනාත්මක ආකල්ප සංවර්ධනය කර ගනී. <br>• විවිධ කළමනාකරණ මට්ටම්වල ‍ක්‍රියා වල නිරත වීමට අදාල කුසලතාවයන් අත්පත් කර ගනී. |
| **පාඨමාලා අන්තර්ගතය** | : | සෑම ශිෂ්‍යයෙකුම පහත සඳහන් කුමන හෝ ක්ෂේත්‍රයකින් අවම වශයෙන් ප්‍රායෝගික පුහුණු පැය 600 ක් සම්පූර්ණ කළ යුතුය. ගිණුම්කරණය, මූල්‍ය, විගණනය, අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය හෝ වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය මගින් අනුමත කරන වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක්. |
| **පුහුණුව ලබන ආකාරය** | : | වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය මගින් අනුමත කරන රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකින් ප්‍රායෝගික පුහුණුව ලබාගත හැක. මෙම පුහුණුව ලබා ගැනීම සඳහා අධ්‍යයන අංශය, ශිෂ්‍යයා සහ අදාල පුහුණු කිරීමේ ආයතනය අතර ලිඛිත ගිවිසුමකට එළඹෙයි. ශිෂ්‍යයා විසින් අධ්‍යයන අංශය විසින් ලබා දී ඇති පුහුණු වාර්තා පොත ක්‍රමානුකූලව පවත්වා ගෙන යා යුතුය. |
| **ඇගයුම් පරිපාටිය** | : | මෙම පාඨමාලා ඒකකය පහත පරිදි ඇගයීම කරනු ලබයි. <br><br>ලකුණු 40% ක් ඇගයීම් මණ්ඩලය විසින් ප්‍රායෝගික පුහුණු වාර්තා පොත සඳහා ලබා දේ. <br>ලකුණු 20% ක් පුහුණු කරු විසින් රහස්‍ය ඇගයීම් වාර්තාව සඳහා ලබා දේ. <br>ලකුණු 40% ක් ඇගයීම් මණ්ඩලය විසින් ශිෂ්‍යයන් ගේ ස්වයං ඉදිරිපත් කිරීම් ( presentation) සඳහා ලබා දේ. <br><br>ඇගයීම් මණ්ඩලය, වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශයේ අධ්‍යයන සාමාජිකයන් ගෙන් සමන්විත වේ. |